# විදේශීය වාර්තාවලින් හෙළිවන ඉපැරණි ලක්දිව සංචරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් විදේශීය වාර්තා කිහිපයක් ඇසුරෙන්)

අයි.එම්.එම්. මධුෂාන්[1]

ප්‍රමුඛ පදඃ විදේශීය වාර්තා , සංචාරක කර්මාන්තය , පුරාණ ලංකාව

## හැඳින්වීම

ලංකාවේ ඓතිහාසික සංචරණය කෙරෙහි අවධානය යොමු කිරීමේදී අතීතයේ පටන් ලංකාව ඉතා වැදගත් සංචාරක කලාපයක් වූ බවට සාධක සපයා ගත හැකිය. ඒ ඓතිහාසිකමය මූලාශ්‍ර ගත තොරතුරු අනුව වේ. අතීතයේ පටන් සංචාරක තෝතැන්නක් වූ ශ්‍රී ලංකාවට විදේශයන්ගෙන් පවා සංචාරකයෝ පැමිණි බවට සාහිත්‍ය ගත තොරතුරු වලින් අනාවරණය වේ. ඒ හුදෙක් විනෝදයට පමණක් නොව වෙළදාම, අධ්‍යාපනය, ආගම ධර්මය හැදෑරීමේ අරමුණු ඇතිව විදේශීය සංචාරකයන් පැමිණි බවට තොරතුරු පවතී. එසේ පැමිණි විදේශීය සංචාරකයන් තමන් ලංකාවේදී ලද අත්දැකීම් සටහන් කර තබන්නේ ලංකාව අනෙක් අයටත් සංචාරය කළ හැකි අගනා කලාපයක් බවට තහවුරු කරමිනි. අනෙක් සංචාරකයන්ට මාර්ගෝපදේශ හැටියටද තම අත්දැකීම් සටහන් කර තැබීමට මොවුන් කටයුතු කර ඇති ආකාරය දැකිය හැකි වේ. එම සටහන් විශේෂයෙන්ම ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී උපයෝගී කරගත හැකි අතරම ඒ තුළින් අපට විදේශීය සංචාරය කෙරෙහි සමකාලීන තොරතුරු සපයා ගත හැකිය. අතීතයේ ලංකාවෙ සංචාරක කර්මාන්තයේ දියුණුව කෙසේදැයි අධ්‍යයනය කිරිම පර්යේෂණ ගැටලුව වූ අතර එය විදේශිකයන්ගේ වාර්තා කිහිපයක් ඇසුරෙන් පෙන්වාදිම මෙම පර්යේෂණයේ අරමුණ විය.

## ක්‍රමවේදය

මෙය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය සිදු කෙරිණි. එහි දී ප්‍රධාන වශයෙන් ප්‍රස්තුතයට අදාළ දත්ත වියුක්ත ව ගෙන විශ්ලේෂණය කොට අධ්‍යයනය කරනු ලැබිය. එය වඩාත් අදාළ වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි ය. ඊට ආධාරක ලෙස ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගී කරගනු ලබයි. ඒ අනුව මෙම පර්යේෂණයේ දී අන්තර්ජාලය මඟින්ද තොරතුරු සපයා ගන්න ලදි.

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Madushamilinda9@gmail.com

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙතෙක් ලැබී ඇති පුරාණතම වාර්තාවන්ට අනුව ලංකාවට පැමිණි පැරණිතම විදේශීය සංචාරකයා වන්නේ චීන ජාතික ෆාහියන් හිමියි. බුදු දහම පිළිබඳව අධ්‍යයනයක යෙදීම උදෙසා පොත්පත් සපයා ගැනීමට උන්වහන්සේ ඉන්දියාව හා ලංකාවට පැමිණි බව දැක්වේ. ක්‍රිස්තු වර්ෂ 406-408 කාලයේ උන්වහන්සේ ලංකාවට පැමිණි බව හා ලංකාවේ ගත කළ බව සඳහන් වේ. ෆාහියන් හිමිට මෙම චාරිකාවට වසර 15ක් ගත වූ බවට විශ්වාස වේ. ඉන් වසර හයක් ඉන්දියාවේ ගත කළ අතර වසර දෙකක් ලංකාවේද ඉතුරු වසර හත චීනයට යෑම සඳහාත් ගතකළ බව ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය වේ.

ෆාහියන් හිමිගේ දේශාතන වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී ලංකාවේ බොහෝ තොරතුරු එතුමන් විසින් සඳහන් කර ඇති ආකාරයක් පැහැදිලි වේ. ෆාහියන් හිමි ලංකාවේ ගත කරන කාලයේදී ලංකාවේ රජ කළේ මහානාම රජු බවත් ෆාහියන් හිමි ලක්දිව බොහෝ බෞද්ධ වෙහෙර විහාර වැඳ පුදා ගත් බවත් සඳහන් කරයි. අනුරාධපුර නතර වී සිටි එතුමන් අභයගිරි විහාරයේ භික්ෂූන් 5000 ක් වාසය කළ බවත් සඳහන් කරයි. මහාවංශයෙහි පවා අභයගිරිය ගැන තොරතුරු අල්ප වශයෙන් ඉදිරිපත් කර ඇති පසුබිමක ෆාහියන් හිමියන් විසින් අභයගිරි ආරාම සංකීර්ණය ගැන ඉදිරිපත් කරන තොරතුරු අනුව අපට අභයගිරිය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමට අවස්ථාව උදාකරයි. එමෙන්ම එක්තරා සැලැස්මකට අනුව සුවිසල් මන්දිරවල නිර්මාණය කර ඇති අභයගිරිය සංකීර්ණයෙහි ජල පහසුකම් සපයන ලිං පොකුණු ආදිය පිළිබඳව ද ෆාහියන් හිමියන් සඳහන් කරයි. අභයගිරිය සංකීර්ණය හා විශාල සන්නිපාත ශාලාව පිළිබඳ සලකා බලන විට අභයගිරිය විශාල භික්ෂු පිරිසකගෙන් සමන්විත වූ බවට ද සිටිය හැකිවේ. සමකාලීන මහා විහාර සංකීර්ණය පිළිබඳව ද තොරතුරු පාහියන් හිමිගේ වාර්තා තුළින් ඉදිරිපත් කරයි. ෆාහියන් හිමි සඳහන් කරන ආකාරයට එම විහාරයේ ශීලයෙහි උසස් හිමිනමක් සිටි බවත් එතුමන් අපවත් වන අවස්ථාවේ එතුමන් රහත් නමක් බවත් එම රහතන් වහන්සේගේ පිරිනිවන් පෑමෙන් පසු රජු විසින් රන්සිවි ගෙයක දේහය තැන්පත් කර චාරිත්‍රානුකූලව චිත්තකය ආදාහනය කළ බවටත් සවිස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කරයි. ඒ අනුව සමකාලීන මහා විහාරයේ භික්ෂු සංඛ්‍යාවට වඩා අභයගිරියේ භික්ෂු සංඛ්‍යාව බෞද්ධ මධ්‍යස්ථානයක් වූ බවත් ය. එමෙන්ම අතීතයේ ලංකාවේ රහතන් වහන්සේලා වැඩ වාසය කළ බවත් පැහැදිලි කරගත හැකිය. ෆාහියන් හිමිගේ වාර්තා වලට අනුව ලංකාවේ විවිධ වර්ගයේ මිල අධික මැණික් පැවැති බවත් එම මැණික් ලැබෙන ප්‍රදේශ වලට රජු විසින් ආරක්ෂක භටයන් යොදවා තිබූ බවත් ලැබෙන මැණික් වලින් 3/10 ක අය බද්දක් වශයෙන් රජුට අයත් වූ බවත් සඳහන් කරයි. ඒ අනුව ලංකාවේ වටිනා මැණික් පැවතිය අයතර එය රටේ ප්‍රධාන ආර්ථික

භාණ්ඩයක් වූ බවත් සිතිය හැකිය. ඒ අනුව අතීත ලංකාවේ බදු අය කිරීම් වැනි ආදායම් මාර්ග රජයට පැවති බවත් මෙයින් අපට තහවුරු කරගත හැකි විය.

ලංකාවේ සංචාරය කළ විදේශීය සංචාරකයකු වන්නේ ඉන්දීය සම්භවයක් ඇති වජ්‍රබෝධි නම් භික්ෂුවයි. උන්වහන්සේගේ තොරතුරුව අනුව උන්වහන්සේ රෝහණයට පැමිණි බවත් එහිදී ශ්‍රී පාද කන්ද වන්දනා කිරීමට ගිය බවත් එහිදී ලද අත්දැකීම් ආදියත් විස්තර කරයි. ශ්‍රී පාද විස්තරයේදී කන්ද මුදුනට නැගී පසු මුහුදු තීරය තෙක් ලංකාවේ සෑම පැත්තක්ම දර්ශනය වූ බවත් වයඹ දිග දිශාව වඩාත් හොඳින් දර්ශනය වූ බවත් සඳහන් කරයි. වර්තමානයේත් රත්නපුර ආශ්‍රිත ප්‍රදේශයේ මැණික් වලට ප්‍රසිද්ධ බැවින් අතීතයේ ලංකාවේ වටිනා මැණික් වලින් මෙම ප්‍රදේශය පරිපූර්ණ ප්‍රසිද්ධියක් පැවති බව පැහැදිලි වේ. වජ්‍රබෝධි හිමියන්ගේ තොරතුරු අනුව අතීතයේ ලංකාවේ වන සම්පත ගැන තොරතුරු පැහැදිලි වේ. වජ්‍රබෝධි හිමියන් විසින් සමනොල ගිර ගැන සජීවී අත්දැකීම් අනුසාරයෙන් විස්තර ඉදිරිපත් කර ඇති අතර සිරිපාදය ගැන තමන් ලද අත්දැකීම ප්‍රථම වරට ඉදිරිපත් කරන්නේද වජ්‍රබෝධි හිමියන් විසිනි. මේ අනුව වජ්‍රබෝධි භික්ෂුවගේ දේශාටන තොරතුරු අපට ඓතිහාසික සංචාරයෙහි තොරතුරු අධ්‍යයනය කළ හැකි මූලාශ්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය.

ක්‍රිස්තු වර්ෂ දහවන සියවසේ ලංකාවට පැමිණි චා ඕ ජුකුවාගේ වාර්තා ද ඓතිහාසික සංචරණය ගැන තොරතුරු අධ්‍යයනය කළ හැකි මූලාශ්‍රයක් ලෙස පෙන්වාදිය හැකිය. ඔහු ලංකාවේ රජු පිළිබඳවත් රජ මැදුරු පිළිබඳවත් විස්තර සපයා ඇත. ඔහු සඳහන් කරන ආකාරයට ලංකාවේ රජු කළු පැහැති බවත් වර්ණවත් කපු පිළියෙන් සැකසුණු ඇඳුමක් රජුට තිබූ බවත් රතු පැහැති සම්වලින් තනන ලද මිරිවැඩි සඟලක් රජු දෙපයේලූ බවත් සඳහන් කරයි. මිරිවැඩි සඟල රනින් අලංකාර කර තිබූ බවටද විස්තර වේ. රජ මාලිගය පුෂ්පරාග රතු හා නිල් යන මැණික්වලින් සරසා තිබූ බවත් ඔහුගේ වාර්තාවල සඳහන් වන අතර සාමාන්‍ය මිනිසුන්ගේ ඇඳුම ඉණ වටා ඔතා ගන්නා සරමක් බව සඳහන් කරයි. එම මිනිසුන් හිස් වැසුම් හා පාවහන් නොපැළැඳ බවත් සඳහන් කරන අතර මිනිසුන්ගේ භාජන තඹ වලින් සකස් වූ බවද සඳහන් කරයි. මේ අනුව පැහැදිලි වන්නේ සමකාලීන ලංකා සමාජයේ ජන ජීවිතය පිළිබඳවයි.

## සමාලෝචනය

විදේශීය වාර්තා මඟින් තහවුරු වන්නේ, ඉපැරැණි ලක්දිව ඉන්දියානු සාගර වෙළෙඳ මාවතේ කේන්ද්‍රස්ථානයක් ලෙස පැවති බවයි. මෙමගින් එහි පැවති බෞද්ධ ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වයත්, සමෘද්ධිමත් වෙළෙඳාම සහ රෝමය, චීනය වැනි රාජ්‍යයන් සමඟ තිබූ ශක්තිමත් අන්තර්ජාතික සබඳතා මැනවින් තහවුරු වේ.

ආශ්‍රිත මූලාශ්‍රය

පතිරණ, යූ.පී.එස්. (2010). ***සංචාරක ව්‍යාපාරය පසුබිම බලපෑම් හා ප්‍රවණතා.*** කොළඹ: සූර්ය ප්‍රකාශන.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2004). ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග.*** වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

සෝමපාල, ජයවර්ධන, පී. (1996). ***සිංහල දේශික විශ්වකෝෂය.*** ගොඩගේ සහ සහෝදරයෝ.